# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


මගේ අංකය / எனது இல. / My Ref. CSS/11/ | ඔබේ අංකය / உனது இல / Your Ref. | දිනය / திகதி / Date 2022-01 18

**ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (තොරතුරු තාක්ෂණ) 01/2022**

දකුණු පළාත් සභාවේ
ආණ්ඩුකාර ලේකම්, සභා ලේකම්, ලේකම් (රාජ්‍ය සේවා කොමිෂන් සභාව)
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
අනෙකුත් ආයතන ප්‍රධානීන් වෙත.

**<u>පළාත් රාජ්‍ය ආයතන තුළ භාවිතා වන පරිගණක මෘදුකාංග සම්බන්ධයෙනි.</u>**

දකුණු පළාතේ රාජ්‍ය ආයතන තම සේවා කාර්යක්ෂමව හා ඵලදායිව සැපයීම සඳහා ආයතනය තුළ සකස් කර ගන්නා හෝ බාහිර පාර්ශවයන්ගෙන් මිළ දී ගන්නා විවිධ වූ මෘදුකාංග භාවිතා කරනු ලැබේ.

02. නමුත් එම සකස් කර ගන්නා ලද මෘදුකාංග සඳහා පසුකාලීනව සේවා සපයා ගැනීමේදී අදාල ආයතන හෝ පුද්ගලයන් සම්බන්ධකර ගත නොහැකි වූ විට මෘදුකාංගය අඛණ්ඩව ක්‍රියාකාරීව පවත්වාගෙන යාමේ ගැටළු සහගත තත්තවයක් පවතින බව නිරීක්ෂණය වේ.

03. එබැවින් මින් ඉදිරියට මෘදුකාංග මිළදී ගැනීමේදී ඊට අදාල තොරතුරු පත්‍රිකාව මා වෙත යොමුකර ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතු බව කාරුණිකව දන්වමි.

04. එමෙන්ම ඔබ යටතේ පවතින සියළු ආයතන වල දැනට භාවිතා වන සියළු පරිගණක මෘදුකාංග වල තිරසර පැවැත්ම සහතික කිරීම සඳහා අදාල මෘදුකාංග වල Source code, User Manual, Database Structures, System architecture පිළිබඳ ගොනුවක් පවත්වාගත යුතු බව දන්වමි. අදාල මෘදුකාංග සංවර්ධනය කරන ලද අභ්‍යන්තර /බාහිර, පුද්ගලයන් / ආයතන මගින් අදාල තොරුතුරු ලබා ගෙන කඩිනමින් අදාල කටයුත්ත ඉටුකරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

05. කාර්යාලයේ නිලධාරින් විසින් සංවර්ධනය කරන ලද මෘදුකාංග සම්බන්ධව ඉහත විස්තර ඇතුලත් ගොනුව අදාල නිලධාරීන් ස්ථානමාරුවන අවස්ථාවේ වැඩ භාරදීමේ දී අනිවාර්යයෙන් භාර දීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතු බවද වැඩි දුරටත් දන්වා සිටිමි.

ආර්.සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119010, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"විශිෂ්ටත්වයෙන් 1 ට එන යහපාලනයක්"